දැරණියගල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 25 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 75,000 ක් වටිනා ලස්සේගම ඉඩම සහ ප්‍රජාශාලා ගොඩනැගිලි ඉදිකිරීමේ වියදම් රු. 1,410,969 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් නිසි පරිදි ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රජාශාලා ඉඩම සහ ගොඩනැගිල්ලෙහි වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇති අතර 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කරන විට ස්ථාවර වත්කම් ගිණුමට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 07 ක මූල්‍ය ප්‍රකාශන හා | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | වෙනස්කම්වලට හේතු සොයා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | උපයෝගී ලේඛන අතර ශේෂයන්ගේ රු. 5,374,962 ක වෙනසක් පැවතුණි | | |
| (ii) | මූල්‍ය ප්‍රකාශන අනුව මුළු වත්කම්වල එකතු වටිනාකම රු.165,995,470 ක් වුවද, භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වටිනාකම රු.167,197,521 ක් වූයෙන් රු.1,202,051 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැඟිලි, වාහන හා යන්ත්‍ර , තොග ගිණුම් (ජල, විදුලි, කර්මාන්ත) වල වෙනසක් නොමැති අතර කාර්යාල උපකරණ, පුස්තකාල උපකරණ හා පුස්තකාල පොත් අතර පවතින වෙනස නිවැරදි කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ලැබිය යුතු ගිණුම් | | |
| | 2014 වර්ෂයේ බස්නැවතුම්පල කඩ කාමර 28 ක් ඉදිකිරීමට ගිවිසුම්ගත වී තිබුණු වෙළඳුන්ගෙන් ලැබියයුතු එක්වන් මුදල් වටිනාකම රු. 26,398,000 ක් විය. | සභාවට ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | ගෙවිය යුතු ගිණුම් | | |
| | 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 25,892,316 ක් විය. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2018.12.31 දිනට රු.25,500,000 ක බස්නැවතුම්පල කඩ කාමර ඉදි කිරීමේ මුදල් වන අතර රු. 392,136 ක මුදල ව්‍යාපෘති 05 ක රැඳවුම් මුදල් වේ. එම රැඳවුම් මුදල් නිදහස් කරන ලෙස පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ වෙත ඉල්ලීම් කර ඇති අතර මුදල් ලද පසු ගෙවීම් සිදු කරමි. |

1.4 අනුකූල නොවීම.

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| | නීති,රීති,රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| | (i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත. | | | |
| | 158(1)(අ) වගන්තිය | වසර 01 ට වැඩි රු.454,922 ක හිඟ වරිපනම් බදු හා අක්කර බදු අයිතිකරුගේ දේපල තහනමට ගෙන හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගෙවීම් පැහැර හැර ඇති අයගේ දේපල තහනම් කිරීම සඳහා නිකුත් කල යුතු නිවේදන බදු කරුවන් වෙත නිකුත් කර ඇත. 2019 මැයි 23,24 යන දෙදින දේපල තහනම් කිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතය. |
| | (ii) 2000 අංක 53 හා 1988 අංක 56 දරණ ජාතික පරිසර පනත යටතේ ප්‍රකාශිත 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය | පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර 03 ක් පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබිය දී සභාව විසින් ව්‍යාපාර බලපත්‍ර ලබා දී තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලුම ව්‍යාපාර හිමියන් ලිපි මගින් දැනුවත් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571 | 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල කල් ඉකුත්වූ රු. 381,584 ක | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කල් ඉකුත්වූ තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,791,495 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවරතන වියදම ඉක්ම වූ ආදායම රු. 8,759,325 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් ,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කල ආදායම** | **රැස් කල ආදායම** | **දෙසැම්බර් 31 දිනට හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කල ආදායම** | **රැස් කල ආදායම** | **දෙසැම්බර් 31 දිනට හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,877,420 | 8,957,752 | **6,913**,454 | 2,044297 | 5,685,830 | 6,389,414 | 4,786,702 | 1,602,712 |
| කුලී | 4,709,850 | 5,998,306 | 5.983,777 | 14,530 | 4,722,200 | 4,772,278 | 4,676,778 | 95,500 |
| බලපත්‍ර ගාස්තු | 647,100 | 753,092 | 753,092 | - | 607,600 | 750,080 | 750,080 | - |
| වෙනත් ආදායම් | 121,404,880 | 82,909,,449 | 37,043,770 | 45,865,679 | 106,762,030 | 75,355,738 | 31,484,538 | 43,871,200 |

#### 2.2.2 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1968 ජූලි 01 දිනැති අංක සී/4 දරන පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ "දියුණු ප්‍රදේශ" ලෙස නම් කරන ලද ලිපිය පරිදි වරිපනම් බදු අය කළහැකි දියුණු ප්‍රදේශ කලින්කල හඳුනා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු අය කරනු ලබන ප්‍රදේශ පුළුල් කිරීමේ ඉදිරි කටයුතු සඳහා DR/PS/RE/01/01/11 අංක හා 2019 මැයි 02 දිනැති ලිපිය මගින් අවශ්‍ය ලියවිලි පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇත. |

2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක කාලයක් ඉක්මවා ඇති හිඟ බලපත්‍ර ගාස්තු, ජල ගාස්තු හා වාහන නැවතුම්පල ගාස්තු පිළිවෙලින් රු. 73,600 ක්, රු. 1,805 ක්, හා රු. 118,470 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2014 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ලේඛනය නිසිපරිදි නඩත්තු නොකිරීම නිසා වෙළඳපල ගාස්තුවල මෙම හිඟය ඇතිවී ඇත. හිඟ මුදල් අයකර ගැනීමට උත්සාහ ගත්තද පැරණි වර්ෂයක හිඟ මුදලක් නිසා බොහෝ ව්‍යාපාරිකයින් ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කර ඇත.<br>හිඟ ජල ගාස්තුව රු.1805 කට අදාළ ස්ථාන වල පුද්ගලයින් නොමැති හෙයින් අයකර ගැනිමට නොහැකි වි ඇත.<br>වාහන නැවතුම්පල ගාස්තු<br>හිඟ මුදලින් රු.59,150 ක් අය කරගෙන ඇති අතර, ඉතිරි හිඟ මුදල්ද අය කර ගැනීමට කටයුතු කරමි. |

2.2.4 වෙළඳ බලපත්‍ර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍ර සඳහා සමීක්ෂණ පවත්වා තිබුණද , එම තොරතුරු ඇතුලත්කර වෙළඳ බලපත්‍ර ලේඛන සකස් කර හිඟ ආදායම් හඳුනා ගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයට අදාලව වෙළඳ බලපත්‍ර සඳහා සමීක්ෂණයක් සිදු කර එම තොරතුරු පදනම් කර ගනිමින් වෙළඳ බලපත්‍ර ආදායම් රැස් කර ඇත. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.6,377,479 ක් හා මුද්දර ගාස්තු රු. 7,077,184 ක් විය. එසේම වර්ෂයක කාලයක් ඉක්ම වූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිලිවෙලින් රු. 3,377,479 ක් හා රු. 2,007,184 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | උසාවි දඩ රු.1,660,146 ක් සහ මුද්දර ගාස්තු රු.1,966,084 ක් 2019 වර්ෂයේ දි ලැබී ඇත. තවදුරටත් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කාර්ය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළාත් පාලන ඇමතිවරයා විසින් ප්‍රසිද්ධ කර තිබුණු කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා 42 ක් 2001 වර්ෂයේදී සභාව විසින් පිළිගෙන තිබුණද ඒ අනුව කටයුතු කර ආදායම් රැස්කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටද සභාව අපොහොසත් වී තිබුණි. | සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කර ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2001 දී ගැසට් කරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවක් ඇති අතර එය නව සභාවට යොමු කර නැවත අලුත් කර ගැනීම හෝ මේ වන විට කෙටුම්පත් කර ඇති අතුරු ව්‍යවස්ථාව ඉදිරියට ගෙන යාමට හෝ කටයුතු කර ඒ අනුව ඉදිරි කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉටු කිරීමට අපේක්ෂිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ පොහොර නිෂ්පාදනය හා අලෙවිය ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කිරීමට අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයක් නොමැතිකම නිසා එය සිදු කිරීම අපහසුවී ඇත. ඉදිරියේදී එම ව්‍යාපෘතිය ඇති කිරීමට ක්‍රියා කරමි. |

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව ඉදිකල දැරණියගල බස්නැවතුම්පල ආශ්‍රිතව කඩ කාමර 50 කින් යුතු දෙමහල් පොදු වෙළද සංකීර්ණයේ වැඩ අවසන් කර නොතිබුණි. | අදාළ ඉදිකිරීම් වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුවේ. | දැරණියගල බස් නැවතුම්පල ආශ්‍රිත කඩ කාමර 2014 දැයට කිරුළ වැඩ සටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඉංජිනේරු සංස්ථාව මගින් ඉදි කිරීමට යෝජිත වුවද එම කටයුතු නිසි ලෙස සිදු නොවිණි. බස් නැවතුම්පල පිහිටි භූමියේ අයිතිකරු පිළිබඳව ගැටළුවක් පවතින බැවින් එම තත්ත්වය නිරවුල් කර ගන්නා තෙක් ඉදි කිරීම් කටයුතු සිදු කිරීම ගැටළු සහගතය. |

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ එකතුවන කසල බැහැර කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | විධිමත් කසල කළමණාකරන වැඩපිළිවෙලක් සකස් කරගත යුතුවේ. | සභා බල ප්‍රදේශය තුල එකතු වන කසල කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවන බැවින් බෝතොට සුසාන භූමියේ පර්චස් 48 ප්‍රමාණයකට බැහැර කරනු ලබයි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේදී තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් සභාව දැනුවත්වී නොතිබුණ අතර 2019 වර්ෂයේ දී වෙනම තිරසර සංවර්ධන සැලැස්මක් පිළියල කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමට කටයුතු කළ යුතුවේ. | තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් සියළු නිළධාරීන් දැනුවත් කර ඉදිරි වර්ෂය සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා කටයුතු කරමි. එසේ වුවත් වාර්ෂික සැලැස්ම සකස් කිරීමේ නිර්ණායකයන් සංවර්ධන ඉලක්ක හා අරමුණු ලඟාකරගත හැකි පරිදි සැලසුම් සකස් කර ඇත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 44 ක් වන අතර දරන්නාට පුද්ගලික වන සේ තනතුරු 15 ක් අනුමත කොට තිබුණි. තනතුරු වර්ග 8 කට අදාලව ස්ථිර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 13 විධිමත්ව පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | සේවා අවශ්‍යතාවය මත මහා සභා අනුමැතිය පරිදි කොන්ත්‍රාත්, ශ්‍රම පදනම සහ අනියම් පදනම මත සේවකයන් බඳවා ගැනීම සිදු කර ඇත. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සබරගමුව පළාත් සභාවට අයත් රු.7,460,875 ක් වූ ටේලර් සහිත ට්‍රැක්ටර් 4 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහන සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේවන තෙක් පවරා ගෙන නොමැති වාහන 09 සභාව වෙත පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |

3.3.2 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට ධාවන තත්ත්වයේ නොතිබෙන රු. 1,150,875 ක් වූ ට්‍රැක්ටරය සහ රු.250,000 ක් වූ අත් ට්‍රැක්ටරය අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව පැවතුණි. | ධාවන තත්වයේ නොපවතින වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | ධාවන තත්ත්වයේ නොතිබුණ රු. 1,150,875.00 ක් වටිනා ට්‍රැක්ටරයේ අලුත්වැඩියා කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. අත්ට්‍රැක්ටරය වෙන්දේසිය සඳහා ඉදිරිපත් කලද, වෙන්දේසි නොවීය. |

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) මීටර් 68 ක් දිග හා මීටර් 2.45 ක් පළල භාරදාහ ගලපහළ මාර්ගය සංවර්ධනය කිරීමේ ද්‍රව්‍ය ඇස්තමේන්තුවට වඩා ගල් කියුබ් එකක් පමණ හා සිමෙන්ති මිටි 31 ක් අඩුවෙන් භාවිතා කර තිබීම නිසා අදාල පාර අපේක්ෂිත ප්‍රමිතියෙන් යුතුද යන්න ගැටළු සහගත විය. එසේම පළාත් සභා, ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ සිදුකරන කිසිදු කර්මාන්තයක් හැමර් යන්ත්‍ර පරීක්ෂාවකින් හෝ ඒවායේ ප්‍රමිතිය පරීක්ෂාකර නොතිබුණි. | කොන්ත්‍රාත් වැඩ නියමිත ප්‍රමිතියෙන් නිම කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල මාර්ගය සඳහා යොදා ගෙන ඇති ද්‍රව්‍ය අනුව බිල්පත් වලට ගෙවීම් සිදු කොට ඇත. ඉදිරියේදී මාර්ග වල ප්‍රමිතිය නිසි ආකාරව පවත්වා ගැනීම සඳහා Core Cutter යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇත. |
| (ආ) ලස්සේගම ප්‍රජාශාලා ගොඩනැගිල්ලෙහි කොන්ක්‍රීට් තට්ටුව සඳහා අඟල් 6 ක පරතරයෙන් යුතුව කම්බි යෙදිය යුතු වුවත් අඟල් 7 සිට 10 පරතරයකින් යුතුව කම්බි යොදා තිබුණි. ඇස්තමේන්තුගත දික් අඩි 40 ක බීම් එකක් ගොඩනැගිල්ලට යොදා නොතිබුණි. | නිසි ප්‍රමිතියකින් යුතුව කොන්ත්‍රාත් කාර්යයන් ඇස්තමේන්තු ගත පරිදි නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම කර්මාන්තයේ කම්බි යොදා ඇති ආකාරය ප්‍රමිතිය හා කල්පැවැත්ම පිළිබඳ ගැටළුවක් පැන නොනගී. තවද එහිදී අධීක්ෂණයේ යම්කිසි අතපසුවීමක් සිදුවී ඇත්නම් එසේ සිදු වන්නේ වසරේ අවසාන දින කිහිපයේදී විශාල කර්මාන්ත ප්‍රමාණයක් ඉටු කිරීමට ඇති නිසා වන අතර එම ගැටළුව අවම කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. | පලාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව 2019 වර්ෂයේ සිට විගණන කළමනාකරණ කමිටු පිහිටුවා ඒ අනුව කටයුතු කරනු ඇත. . |

4.2 නොවිසඳි ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාව සතු අක්කර 01 යි රූඩ් 3 යි පර්චස් 30 ක් වූ ඉඩම් කොටස් 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු දේපල තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | ආසන්නයේ පවතින ඇල මාර්ගයට සෝදා ගොස් ඇති ඉලුක්තැන්න අම්බලමගාව වත්ත නමැති පර්චස් 01.05ක් වන ඉඩම සම්බන්ධව තහවුරුවක් ලබා ගෙන ලේඛන වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලලාන් වැවිලි සමාගම සතු හෙක්ටයාර් 2 පර්චස් 35.37 ක ඉඩම් කොටස මිලට ගැනීම සඳහා 2018 ජූලි 25 දින රු.155,000 ක අත්තිකාරම් මුදලක් දැරණියගල ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවීම් කර තිබුණද, මෙතෙක් පවරා ගැනීමේ කටයුතු නිමකර නොතිබුණි. | සුදුසු ඉඩමක් ලබා ගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුයි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයක් ඇති කිරීම සඳහා ලලාන් වැවිලි සමාගම විසින් උප බදු ගෙන ඇති උඩබාගෙ වත්තේ ඉඩම් කොටස පවරා ගැනීමට කටයුතු කළද පවරා ගැනිමේ කටයුතු මෙතෙක් සිදුවී නොමැති අතර මෙම ඒකකය පිහිටුවීම මහජන විරෝධතා මත තාවකාලිකව අත්හිටුවා ඇත. |